# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

**වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමු වසර පරීක්ෂණය (බාහිර) - 2010**
**2011 දෙසැම්බර් /2012 ජනවාරි**

**BCOM E 1035 - මූල්‍ය ගිණුම්කරණය**

මුළු ප්‍රශ්ණ සංඛ්‍යාව 05 යි. කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

01. අ. තාරුක, මහේෂ් සහ චාරුක පිළිවෙලින් 1/2, 1/3, හා 1/6 යන අනුපාතයකට ලාභ බෙදා ගන්නා හවුල් ව්‍යාපාරයක නිරත විය. පහත අයුරින් ශේෂ පත්‍රය පවතින 2010 දෙසැම්බර් 31 දින ඔවුන් හවුල් ව්‍යාපාරය විසුරුවා හරින ලදී.

2010 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය

| වගකීම් | වටිනාකම (රු) | වත්කම් | වටිනාකම (රු) |
|---|---|---|---|
| ප්‍රාග්ධනය - තාරුක | 135,000 | නිදහස් දේපළ | 135,000 |
| - මහේෂ් | 112,500 | යන්ත්‍ර | 72,000 |
| - චාරුක | 82,500 | ආයෝජන | 63,000 |
| මහේෂ්ගේ ණය | 60,000 | තොග | 59,250 |
| ගෙවියයුතු බිල් | 37,500 | විවිධ ණයගැතියෝ | 87,000 |
| විවිධ ණයහිමියෝ | 45,000 | බැංකු මුදල් | 56,250 |
| | 472,500 | | 472,500 |

යන්ත්‍ර රු. 67,500 කට මහේෂ් පවරා ගන්නා ලදී. තාරුක ආයෝජන රු. 60,000 කට චාරුක නිදහස් දේපළ රු. 142,500 කටද පවරා ගන්නා ලදී.

ඉතිරි වත්කම් පහත පරිදි උපලබ්ධි විය.

විවිධ ණයගැතියෝ රු. 84,750, හා තොගය රු. 54,750, විවිධ ණය හිමියෝ 5 % ක වට්ටමක් සහිතව බේරුම් කරන ලදී. ගෙවිය යුතු බිල් රු. 34,500 කට චාරුක පවරා ගන්නා ලදී. පොත් වල නොදැක්වුනු රු. 4500 ක වගකීම් ගෙවන ලදී. පොත්වල නොදැක්වුනු කාර්යාල පරිඝනකයක් රු. 13,500 කට උපලබ්ධි විය. විසුරුවා හැරීමේ වියදම් රු. 4500 කි.

ඉහත තොරතුරු උපයෝගි කරගනිමින් ඔබ විසින් පිළියෙල කිරීමට අවශ්‍ය වන්නේ,

i. උපලබ්ධි ගිණුම

ii. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්

ආ. i. හර්ෂ සහ රුවන් 4:3 අනුපාතයට ඔවුන්ගේ හවුල් ව්‍යාපාරයේ ලාභ බෙදා ගන්නා ලදී. ජානක නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගන්නා ලදී. හර්ෂ ඔහුගේ කොටසින් 1/5 ක් ද රුවන් ඔහුගේ කොටසින් 1/3 ක් ද ජානකට පවරන ලදී. නව ලාභ බෙදාහැරීමේ අනුපාතය ගණනය කරන්න.

(ලකුණු 20)

ii. පසුගිය වර්ෂ සඳහා හවුල් ව්‍යාපාරයක ලාභ පහත පරිදි වේ.

| | ලාභ රු. |
|---|---|
| 2006 | 80,000 |
| 2007 | 85,000 |
| 2008 | 90,000 |
| 2009 | 100,000 |
| 2010 | 110,000 |

බරතැබූ සාමාන්‍ය ලාභය වර්ෂ දෙකක මිලදී ගැනීමක් ලෙස සලකා කීර්තිනාමයේ අගය ගණනය කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 30)

02. අ. පහත සඳහන් ගණුදෙනු ප්‍රධාන කාර්යාලය හා ශාඛාව අතර සිදුවිය.

| | ප්‍රධාන කාර්යාලය රු. | ශාඛාව රු. |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය විසින් ශාඛාවට ඉන්වොයිස් කළ භාණ්ඩ | 388,000 | |
| ශාඛාවට ලද භාණ්ඩ | | 350,000 |
| ශාඛාව ආපසු හරවා යැවූ භාණ්ඩ | | 12,500 |
| ප්‍රධාන කාර්යාලයට ලද භාණ්ඩ | 7,500 | |
| ප්‍රධාන කාර්යාලය වෙත් කරන ලද ප්‍රේෂණ | | 235,000 |
| ප්‍රධාන කාර්යාලය ලද ප්‍රේෂණ | 220,000 | |
| ශාඛාව වෙනුවෙන් ප්‍රධාන කාර්යාලය ගෙවූ වියදම් | 10,000 | |
| ශාඛාවේ ණයගැතියන්ගෙන් කෙළින්ම ප්‍රධාන කාර්යාලයට ලද මුදල් | 25,000 | |
| වර්ෂයේ ශාඛා ශුද්ධ ලාභය | | 75,000 |

ඔබ විසින් පිළියෙල කිරීමට අවශ්‍ය වන්නේ.

i. ශාඛා ජංගම ගිණුම

ආ. කොළඹ පිහිටි සීමා සහිත ජමුනා සමාගමේ ශාඛාවක් නුවර පිහිටුවා ඇත. 2011 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| | කොළඹ (රු. 000) | | නුවර (රු. 000) | |
|---|---|---|---|---|
| | හර | බැර | හර | බැර |
| දේපළ, පිරියත හා උපකරණ | 33,000 | - | 15,000 | - |
| සමුච්චිත ක්ෂය - 2010/04/01 | - | 6,600 | - | 3,000 |
| ගැණුම් | 153,000 | - | - | - |
| විකුණුම් | - | 126,000 | - | 66,000 |
| ශාඛාවට යැවූ භාණ්ඩ / ශාඛාව ලද භාණ්ඩ | - | 66,000 | 60,000 | - |
| තොගය - 2010/04/01 | 4,500 | - | 660 | - |
| උපලබ්ධි නොවූ ලාභ සඳහා වෙන් කිරීම | - | 60 | - | - |
| ජංගම ගිණුම් | 20,580 | - | - | 14,280 |
| අනෙකුත් ආදායම් | - | - | - | 4,380 |
| පරිපාලන වියදම් | 6,600 | - | 2,700 | - |
| බෙදාහැරීමේ වියදම් | 5,100 | - | 1,200 | - |
| මූල්‍ය වියදම් | 1,800 | - | 1,200 | - |
| ණයගැතියෝ/-ණය හිමියෝ | 19,230 | 12,000 | 6,000 | - |
| බැංකු ශේෂය | 2,550 | - | 900 | - |
| 2010/04/01 රඳවාගත් ලාභ | - | 2,700 | - | - |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | - | 33,000 | - | - |
| | 246,360 | 246,360 | 87,660 | 87,660 |

අතිරේක තොරතුරු

1. ප්‍රධාන කාර්යාලයෙන් ශාඛාවට පිරිවැයට 10 % ක් එකතු කළ මිලට භාන්ඩ ඉන්වොයිස් කරන ලදී.

2. 2011.03.31 දිනට තොග

   - ප්‍රධාන කාර්යාලය (පිරිවැයට) - රු. 9300,000

   - ශාඛාව (ඉන්වොයිසි මිලට ) - රු. 4510,000

3. 2010/11 වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු. 12525,000 කට ඇස්තමේන්තු කරන ලදී.

4. සමාගමේ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය වනුයේ පිරිවැයෙන් 10 % ක් ක්ෂය කිරීමයි.

ඔබ විසින් පිළියෙල කිරීමට අවශ්‍ය වන්නේ,

i. 2011 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය.

ii. 2011 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය.

(ලකුණු 25)

(මුළු ලකුණු 30)

03. අ. බද්ධ ව්‍යාපාරය හා හවුල් ව්‍යාපාරය අතර වෙනස්කම් කවරේද ?

(ලකුණු 05)

ආ. ලී බඩු මිලදී ගැනීම් හා විකිණීම සඳහා ජනක සහ මංජු බද්ධ ව්‍යාපාරයක් පිහිටුවා ගන්නා ලදී. ඔවුන් දෙදෙනා පිළිවෙලින් ලාභ අලාභ 4:5 අනුපාතයට බෙදා ගැනීමට එකඟ විය. 2010 වර්ෂයේ පහත ගනුදෙනු සිදු විය.

මැයි 06 - ජනක හා මංජු පිළිවෙලින් රු. 40,000 ක් හා රු. 50,000 ක් යොදා බද්ධ බැංකු ගිණුමක් විවෘත කරන ලදී.

මැයි 15 - එකක් රු. 5,000 බැගින් පුටු 10 ක් මිලදී ගත් අතර ගෙන එමේ කුලී රු. 6000 ක් ද දරන ලදී.

මැයි 16 - මෙම පුටු අළුත්වැඩියා කිරීම සඳහා රු. 8000 ක් දරන ලදී.

මැයි 20 - පුටු 9 ක් එකක් රු. 7500 බැගින් විකුණන ලද අතර ඉතිරි පටුව මංජු පිරිවැයට ගන්නා ලදී.

මැයි 22 - මංජු ජනකට රු. 3,000 ක් ගෙවන ලදී

මැයි 25 - ඔවුන් බද්ධ ව්‍යාපාරය විසුරුවා හැරීමට තිරණය කරන ලද අතර ගිණුම් පියවන ලදී.

ඉහත තොරතුරු උපයෝගී කරගනිමින් ඔබ විසින් පිළියෙල කිරීමට අවශ්‍ය වන්නේ,

i. බද්ධ ව්‍යාපාර ගිණුම

ii. බද්ධ බැංකු ගිණුම

iii. බද්ධ හිමියන්ගේ ගිණුම

(ලකුණු 15)

(මුළු ලකුණු 20)

04. 2011 වර්ෂයේ X ගේ ආයෝජන සඳහා පහත ගනුදෙනු සිදු වූ අතර, ඒවා ආශ්‍රයෙන් ආයෝජන ගිණුම පිළියෙල කරන්න.

ජනවාරි 31 - රු. 100, 12 % , රු. 100,000 ක ණයකර A සමාගමෙන් එකක් රු. 102 බැගින් මිලදී ගන්නා ලදී.

ජූලි 31 - 12 % , රු. 50,000 ක ණයකර එකක් රු. 105 බැගින් විකුණන ලදී.

දෙසැම්බර් 31 - ලැබිය යුතු පොළී ලැබිණි (මාස 06 කට )

(ලකුණු 10)

05. අ. ශ්‍රී. ගි. ප්‍ර. අංක 02 ( තොග) අනුව පහත දෑ නිර්වචනය කරන්න.

i. තොග

ii. ශුද්ධ උපලබ්ධි අගය

(ලකුණු 05)

ආ. ශ්‍රී. ගි. ප්‍ර අංක 16 (දේපළ, පිරියත හා උපකරණ ) අනුව ප්‍රත්‍යාගණනයකදී සඳහා සිදු කළ යුතු හෙළිදරව් කිරීම් මොනවාද ?

(ලකුණු 05)

(මුළු ලකුණු 10)